ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date 2025.02.10 |

ඩී.එම්.ජ්. ශාලිකා දිසානායක මිය
අංක 8/1 බක්මීරුප්ප,
වැල්ලරාව,
කුරුණෑගල

පැමිණිලිකාරිය

පැමිණිලි අංකය : **HRC/PTM/74/24**

1. ඩබ්.ජ්. බුද්ධික ප්‍රභාත් මයා
   සභාපති,
   පාලක මණ්ඩලය,
   සී.ස බිංගිරිය විවිධ සේවා,
   සමුපකාර සමිතිය,
   වයඹ පළාත.

2. එල්.එම්.ජ් අශෝක කුමාර මයා
   සාමාජික -පාලක මණ්ඩලය,
   සී.ස බිංගිරිය විවිධ සේවා,
   සමුපකාර සමිතිය,
   වයඹ පළාත.

3. ඩබ්.ජ්.නන්දන සංජීව මයා,
   සාමාජික -පාලක මණ්ඩලය,
   සී.ස බිංගිරිය විවිධ සේවා
   සමුපකාර සමිතිය,
   වයඹ පළාත.

4. ලේකම්,
   සමුපකාර සේවක කොමිෂන් සභාව,
   වයඹ පළාත.

වගඋත්තරකරුවන්

<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

පැමිණිලිකාරිය වන ඩී . එම්. ජ්. ශාලිකා දිසානායක විසින් 2024.07.10 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ සී/ස බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ 03/2020 සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛණයට අනුව නියෝජ්‍ය


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්.ජ්.ද මෙල් මාවත, කොළඹ-04.<br>இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04.<br>No.14, R.A. De Mel Mawatha, Colombo-04. | සභාපති<br>தவிசாளர்<br>Chaiman | 011-2505551 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541/74 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |

ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hresl.lk

අනුව සම්මුඛ පරීක්ෂණය පවත්වා මාසයක් තුල එම ප්‍රතිඵල සමූපකාර සේවක කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව ද එකී වාර්තාවේ සඳහන් කර ඇත.

පැමිණිල්ලට අදාළ තනතුර වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුර සහ තවත් තනතුරු කීපයකට අදාලව ජේ.ඒ. චන්ද්‍රා මානෙල් කුමාරි යන අයගේ සුදුසුකම් සනාථ කරගැනීමට 2024.05.22 දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත සහ 2024.07.19 දින කොළඹ විශ්ව විද්‍යාලය වෙත ලිපි යොමු කර ඇති බව ද එකී වාර්තාවෙහි වැඩිදුරටත් දක්වා ඇත.

තවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර සඳහා ජේ.ඒ. චන්ද්‍රා මානෙල් කුමාරි යන අය අභ්‍යන්තර සේවිකාවක් වශයෙන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම යන හේතුව මත එම තනතුරට කේ.එච්.පී.එස්. රසිකා පතිරණ යන තැනැත්තිය තෝරා ගෙන තිබීමට විරුද්ධව පෙත්සම්කාරිය විසින් ගොනු කරන ලද පැමිණිල්ල බල රහිත බව ද එකී වාර්තාවේ දක්වා ඇත.

2024.07.15 වන දින ගත් පාලක මණ්ඩලයේ තීරණයක් අනුව ජේ.ඒ. චන්ද්‍රා මානෙල් කුමාරි යන අයගේ සුදුසුකම් සනාථ කරගන්නා තෙක් එම අය සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ තනතුරු 04 ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද කිරීමට පාලක මණ්ඩලය තීරණය කළ බවත් එම වාර්තාවේ සඳහන් කර ඇත.

සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් 2023.11.02 වන දින සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලිපියක් යොමු කරමින් අයදුම්පත් කැඳවීමේදී ප්‍රමාද දෝෂ සිදු වී ඇති බැවින් සමිතියේ පුරප්පාඩු පවතින තනතුරු දීර්ඝකාලීනව පැවතීම අයහපත් ලෙස බලපා ඇති බැවින් විධිමත් පරිදි බඳවා ගැනීමට කටයුතු කරන ලෙස සඳහන් කර ඇති බවත්, ඒ අනුව විධිමත් බඳවා ගැනීම යනු සමිතියේ අනුමත පිරිස් බල තක්සේරුව අනුව හා කොමිෂන් සභාවේ 3/2020 චක්‍රලේඛයට අනුව නීත්‍යානුකූලව බඳවා ගැනීම වන බැවින් වත්මන් පාලක මණ්ඩලය විසින් විධිමත් බඳවා ගැනීම් සඳහා 2024.01.22 දිනැතිව පුවත්පත් දැන්වීම් පලකරමින් සමිතියේ පුරප්පාඩු පවතින සියලු තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නැවත අයදුම්පත් කැඳවීමක් කළ බවත් 1 වන වගඋත්තරකරු වන සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමූපකාර සමිතියේ සභාපතිවරයා විසින් සිය වාර්තාව තුළින් වැඩිදුරටත් දක්වා ඇත.

<u>පැමිණිලිකාරියගේ විරෝධතා</u>

2024.08.12 දිනැතිව පැමිණිලිකාරිය විසින් වගඋත්තරකාර පාර්ශවයේ ඉහත දක්වන ලද කරුණු දැක්වීම් වලට අදාළව විරෝධතාවයන් පහත පරිදි ඉදිරිපත් කර ඇත.

3/2020 චක්‍රලේඛනාකූලව සුදුසුකම් නොමැති ජේ.ඒ. චන්ද්‍රා මානෙල් යන අයට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දීමෙන් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු වී ඇති බවත්, 3/2020 චක්‍රලේඛනයේ 7.7 වගන්තියට අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා මාසයක් ඇතුළත ඊට අදාළ ලේඛන සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත යවා තනතුරු සඳහා පත්වීම් අනුමත කරවා ගත යුතු වුවත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුරට අදාළ තොරතුරු එලෙස යවා නොමැති බවත්, ජේ.ඒ. චන්ද්‍රා

ජේ.ඒ.චන්ද්‍රා මානෙල් යන අයගේ සුදුසුකම් විමසීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව දන්වමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුර සඳහා නිලධාරියෙකු අනුමත කිරීම ප්‍රමාද කළ නමුත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර සඳහා කේ.එච්. රසිකා පතිරණ යන අයව නිර්දේශ කර අනුමත කිරීමට සමුපකාර කොමිෂන් සභාවට යවා ඇති බව ද පැමිණිලිකාරිය පෙන්වා දෙයි.

__නිරීක්ෂණ__

සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුර සඳහා පුරප්පාඩු 2023 ජනවාරි මාසයේ සිට ඇති වී තිබෙන බවත්, 2023.04.29 වන දින එකී තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති නමුත්, ඊට අදාළව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නොමැති බවත් නිරීක්ෂණය වේ. පැමිණිලිකාරිය ද එකී තනතුර සඳහා අයදුම් කර තිබූ බැවින් ඇය විසින් එකී සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීම සම්බන්ධයෙන් 2023.09.01 දිනැතිව වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, එකී අභියාචනයට පිළිතුරු වශයෙන් අංක ස.සේ.කො 06/බිංගිරිය නියෝග අංක 593/2023 සහ 2023.11.02 දිනැති ලිපිය මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුර සඳහා ප්‍රමාදයකින් තොරව විධිමත් බඳවා ගැනීමක් සිදු කරන ලෙස සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියට නියෝග කර තිබෙන බවද පෙනී යයි.

එසේම, සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර්වරයා විසින් අංක NWP/CCD/3/1/2/1/17/2 සහ 2023.11.20 දිනැති ලිපිය මගින් සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුරෙහි පවතින පුරප්පාඩුව කඩිනමින් පිරවීමට කටයුතු කරන ලෙසත්, සමුපකාර සේවකයින් සම්බන්ධ කටයුතු වලදී සමුපකාර සේවක කොමිෂන් සභා නෛතික විධිවිධානයන්ට අනුව කටයුතු කරන ලෙසත් සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය වෙත දන්වා ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අංක NWP/GOV/AD 09/16/14/ වෙළුම VII සහ 2024.01.12 දිනැති ලිපිය සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය වෙත යොමු කරමින් 2024.01.08 දින දුරකථනයෙන් උපදෙස් දුන් පරිදි 2024.01.15 දිනට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුර සඳහා විධිමත් බඳවා ගැනීමක් සඳහා පැමිණිලිකාරියට ද ඉදිරිපත් විය හැකි පරිදි සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ආදී ඉදිරි කටයුතු සිදු කරන ලෙස දන්වා ඇති බව ද පෙනී යයි.

එසේවුවද, 1 වන වගඋත්තරකරු වන සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා විසින් ඉහත කී සමුපකාර සේවක කොමිෂන් සභාවේ නියෝගය හෝ සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර්වරයා විසින් සිදු කළ දැනුම්දීම හෝ වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ දැනුම්දීම අනුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවේ.

සමත්වීම හෝ සමග TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04කට හෝ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම,

හෝ

ඇ) පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයෙන් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත්වීම සමඟ බැංකු අංශයේ TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04කට හෝ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

පැමිණිලිකාරිය විසින් ජාතික සමූපකාර සංවර්ධන ආයතනය මගින් මෙහෙයවනු ලබන බැංකු කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් 2021.02.22 වන දින සිට 2022.08.25 වන දින දක්වා අවුරුදු එකයි මාස හයක කාලසීමාවක් සාර්ථකව හදාරා ඇති බව ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පෙනී යයි. 03/2020 චක්‍රලේඛනයේ අංක 5 යටතේ සුදුසුකම් සපුරා ගැනීම සඳහා පිළිගත් ආයතන දක්වා ඇති අතර එහි අංක 15 යටතේ ජාතික සමූපකාර සංවර්ධන ආයතනය, පිළිගත් ආයතනයක් බවට සඳහන්ව ඇත. එසේ හෙයින් ඉහතින් දක්වා ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බැංකු) තනතුර සඳහා අදාළ වන සුදුසුකම් අතරින් "ඇ" යටතේ දක්වා ඇති පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත බැංකු කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාවක් සමත්වීම යන සුදුසුකම පැමිණිලිකාරිය විසින් සපුරා ඇති බව තහවුරු වේ.

එසේම, පැමිණිලිකාරිය 2015.02.20 වන දින සිට ග්‍රාමීය බැංකු කළමණාකරු III තනතුරෙහි සේවය කර ඇති බව නිරීක්ෂණය වේ. 03/2020 චක්‍රෙල්ඛණයේ උපලේඛන අංක 01 ප්‍රකාරව අනුමත තනතුරු හා ඒවාට අයත් මට්ටම් දක්වා ඇති අතර එහි අංක 28 යටතේ බැංකු කළමණාකරු III තනතුර, SL වැටුප් පරිමාණයේ තනතුරක් බව සඳහන් කර ඇත. ඒ අනුව 2015.02.20 වන දින සිට අයදුම්පත් කැඳවූ 2024.02.22 දින වන විට වසර නවයක කාලයක් SL වැටුප් පරිමාණයේ තනතුරක පැමිණිලිකාරිය සේවය කර ඇති බැවින් ඉහත "ඇ" යටතේ දක්වා ඇති SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම, යන සුදුසුකම ද පැමිණිලිකාරිය විසින් සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව ඉහතින් දක්වා ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බැංකු) තනතුර සඳහා අදාළ වන සුදුසුකම් අතරින් "ඇ" යටතේ දක්වා ඇති පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත බැංකු කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාවක් සමත්වීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම යන සුදුසුකම් පැමිණිලිකාරිය විසින් සපුරාගෙන ඇති බව තහවුරු වේ.

තවද, 3/2020 චක්‍රලේඛයේ 7.7 වගන්තියට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ පවත්වා මසක කාලයක් ඇතුළත සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තනතුරට අදාළ බඳවා ගැනීම අනුමත කරවා ගත යුතු බවට දක්වා තිබුණ ද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බැංකු) තනතුරට අදාළව පැවති සම්මුඛ

ඇත්තේ සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ පාලක මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) තනතුර සඳහා කේ.එච්.පී.එස්. රසිකා පතිරණ යන අය පත් කිරීමට තීරණයක් ගෙන එය කොමිෂන් සභාවට යවා කොමිෂන් සභාවේ අනුමැතිය මත අදාළ පත් කිරීම සිදු කරන ලද බවයි. ඉල්ලුම් කරන ලද අයදුම්කරුවෙකුගේ සුදුසුකම් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් පවතින අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන වෙතින් තොරතුරු විමසා තිබිය දී, ඒ සඳහා පිළිතුරු ලැබීමට ප්‍රථම එක් තනතුරකට අදාළව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ප්‍රමුඛතා ලේඛනයේ පළමු ස්ථානයට පත් තැනැත්තිය වෙත අදාළ තනතුර ලබා දීම සඳහා නිර්දේශ කිරීමත්, තවත් ඒ හා සමාන තනතුරක් සඳහා එලෙස නොකිරීමත් ගැටළු සහගත බව ද නිරීක්ෂණය වේ.

වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අංක ස.සේ.කො 06/බිංගිරිය/ත.අ.vii වෙළුම නියෝග අංක787/2024 සහ 2024.12.24 දිනැති ලිපිය, සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා වෙත යොමු කරමින් චන්ද්‍රා මානෙල් යන අයට අනෙකුත් තනතුරු සඳහා පැවති සම්මුඛ පරීක්ෂණ වලදී මූලික සුදුසුකම් නොමැති සේ සලකා නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බැවින් 2024.05.08 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බැංකු) තනතුර සඳහා පවත්වා ඇති සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය ද යොමු කිරීමට කටයුතු කරන ලෙස නියෝග කර ඇති බව නිරීක්ෂණය වේ.

සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ ඉහත කී ලිපියට පිළිතුරු වශයෙන් අංක 1/7/4/39 සහ 2025.01.03 දිනැති ලිපිය වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත යොමු කරමින් 2024.05.08 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බැංකු) තනතුර සඳහා පවත්වා ඇති සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රමුඛතා ලේඛනයේ සඳහන් පරිදි ලකුණු 19ක් ලබා ගනිමින් පළමු ස්ථානය ලබාගත් පැමිණිලිකාරිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බැංකු) තනතුර සඳහා අනුමත කිරීම සුදුසු බවට 2025.01.02 වන දින පාලක මණ්ඩලය තීරණය කර ඇති බවට දන්වා ඇති බවත් නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත සඳහන් සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී 2024.05.08 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයන්හි දී ජේ.ඒ.චන්ද්‍රා මානෙල් කුමාරි ජයසිංහ යන අයට අනෙකුත් තනතුරු සඳහා පැවති සම්මුඛ පරීක්ෂණ වලදී මූලික සුදුසුකම් නොමැති සේ සලකා නිර්දේශ ඉදිරිපත් කිරීමටත්, පැමිණිලිකාරිය සුදුසුකම් ලබා පළමු ස්ථානය හිමි කරගත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බැංකු) තනතුරට අදාළ සම්මුඛ පරීක්ෂණයේ නිර්දේශ යැවීම පමණක් ප්‍රමාද කිරීමටත් සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය ක්‍රියා කර ඇති බව තහවුරු වේ. ඒ හේතුවෙන් පැමිණිලිකාරිය හට එකී තනතුරට පත්වීමට තිබූ අවස්ථාව අහිමි වීම නිසා 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වන පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම 1 වන, 2වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

පිටපත් -: 01. අමාත්‍යතුමා,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ 04. - කරුණු දැනගැනීම සඳහා

02. සමූපකාර සංවර්ධන කොමසාරිස්,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ 02. - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා